# සාමූහික ශක්තිය තුළින් ස්වයං පෝෂණයට මඟ

සංවිධානාත්මකව සැලසුම් කරන ලද්දවූ ප්‍රයත්නයක් තුළින් වී හා වෙනත් ආහාර භෝග නිෂ්පාදනය සාර්ථක ලෙස වැඩි කළ හැකිය යන සංකල්පනය යටතේ අත්හද බැලීමේ ව්‍යාපෘතියක් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ උපදෙස් ඇතිව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ගල්ගමුවෙහි ආරම්භකර තිබේ. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ උපදේශක නුරාල් ඇම් හක් විසින් එම ව්‍යාපෘතිය අළලා පිළියෙල කරන ලද වාර්තාවක් ඇසුරෙන් මේ ලිපිය සකස් කෙරිණි.

සතුටුදායක අන්දමේ ඉඩම් – මිනිස් අනුපාතයක්, වර්ෂාපතනයක් සහ සූර්ය රශ්මියක් මෙන් ම, ඉතා අගනා පුරාණ වාරි පද්ධතියක් ද උරුම වීම අතින් ශ්‍රී ලංකාව වාසනාවන්ත රටකි. කෘෂිකර්ම ආර්ථිකය රටේ ආර්ථිකයෙහි මුල් තැන් ගන්නා අතර, වැවිලි අංශය සහ ගෘහ (ග්‍රාමීය) අංශය යනුවෙන් එය මූලිකව දෙකොටසකට බෙදිය හැකි ය. ගෘහ (ග්‍රාමීය) අංශය ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ වී සහ වෙනත් ආහාර භෝග වගා කරන සුළු ගොවීන් ගෙනි.

ආහාර අතින් විශේෂයෙන් ම වී වලින් ස්වයංපෝෂිත වීමට තරම් ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථාවන් ශ්‍රී ලංකාවට ඇති නමුත් එම ඉලක්කය තවම ඉටු වී නොමැත. අරමුණෙහි පිහිටුවා මනා ලෙස උනන්දු කරවන ලද්දවුන්, මනා ලෙස පුරුදු පුහුණු කරවන ලද්ද වූ සහ මනා ලෙස ආධාර උපකාර සපයන ලද්දවුන්, ගොවි සමූහයක් මගින් ආහාරයෙන් ස්වයංපෝෂිත වීමේ අරමුණ ඉටු කර ගැනීමට පුළුවන.

කුරුණෑගල, ගල්ගමුවෙහි ක්‍රියාත්මක කෙරෙන, සුළු ගොවීන් ගේ සංවිධානවල නායකයන් සඳහා වන කළමනාකරණ පුහුණු ව්‍යාපෘතිය පහත දක්වෙන සංකල්පනා පදනම් කර ගෙන අරඹන ලද්දකි.

1. සංවිධානවූන්, සැලසුම් කරන ලද්දවුන්, ප්‍රයත්නය තුළින් වී සහ වෙනත් ආහාර භෝග නිෂ්පාදනය වැඩි කිරීමට හැකි ය.
2. සාමූහික ක්‍රියාකාරීත්වය සංවිධානවූන්, සැලසුම් කරන ලද්දවුන් ප්‍රයත්නය සඳහා වඩාත් පහසු මාර්ගයක් වෙයි.
3. කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සාමූහික සැලසුම් සම්පාදනය සහ සාමූහික ක්‍රියාකාරීත්වය ද උගැනීමට ගොවි නායකයන් මෙන් ම සුළු ගොවි සංවිධානවල සාමාජිකයන් ද පුහුණු කරවීම කළ හැකි දෙයකි.

කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා සැලසුම් සකස් කිරීමෙහි දී ග්‍රාමීය මට්ටමේ ජනතාව ගේ සහායෙන් ද උපරිම ප්‍රයෝජන ලබා ගැනීම පිණිස සැලසුම් කටයුතු පහළ මට්ටමේ සිට ඇරඹීමට උත්සාහ දැරීම වඩාත් තර්කානුකූලය. වී නිෂ්පාදන සැලසුම් සම්බන්ධයෙන් දැනට අනුගමනය කෙරෙන ක්‍රමය වූ කලී සාමාන්‍යයෙන් ඉටු නොවෙන ආකාරයේ ඉලක්ක නියම කිරීම ය. බොහෝ අවස්ථාවන් හි දී ඉහළින් නියම කෙරෙන ඉලක්කයන් ස්වභාවික හේතූන් සහ වෙනත් කරුණු ද නිසා පහළම මට්ටමේ දී ඉටු වන්නේ නැත. 1976 දී, වවුනියාව දිස්ත්‍රික් සැලැස්ම යටතේ සැලසුම් ඉලක්කය වූ ඉඩම් අක්කර 67,000 ක් අතුරෙන් සත්‍ය වශයෙන් ම වගා කර තිබුණේ අක්කර 45,000 ක් පමණි. එයින් ද අක්කර 36,000 ක් ම කලට නිසි ලෙස වැසි නොලැබීම නිසා පාළු වී ගියේ ය.

වෙනත් සැලසුම් සේම කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීමෙහි දී ද නිරන්තර සමාලෝචනය අවශ්‍ය වන අතර, වෙනස් වන තත්ත්වයන්ට අනුකූලව සංශෝධනවලට භාජනය කිරීම



සාකච්ඡාවකට කෘෂි සේවා මධ්‍යස්ථානයට එමින්.

ද අවශ්‍ය දෙයකි. සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම ද උදෙසා කිසියම් වැඩ පිළිවෙළක් මෙහිලා අවශ්‍ය වෙයි. එබැවින්, එවැනි කාර්යයන් ඉටු කිරීම සඳහා පහළම මට්ටමින් කිසියම් ස්ථාවර ආයතනයක (සංවිධානයක) අවශ්‍යතාවයක් පවතී. ක්‍රියාකාරී ගොවීන් ගේ සාමාජිකත්වයෙන් යුතු කණ්ඩායම් බිහි කිරීම ගොවීන් සඳහා එවැනි ස්ථාවර සංවිධානයක් ගොඩ නැංවීම සඳහා ගනු ලබන එක් පියවරකි.

ඊළඟට මතු වන ප්‍රශ්නය වනුයේ සැපයුම් සේවාවන් වලින් ගොවීන්ට පාධාර උපකාර කිරීම ය. ජලය, ණය, පෝර, බීජ, කෘමි නාශක ආදි යෙදවුම් සැපයීම ද, ගොවිතැනට අදාළ දියුණු ක්‍රමෝපක්‍රම පිළිබඳව දැනුම, තොරතුරු ආදි වෙනත් සේවාවන් සැපයීම ද මීට ඇතුළත් වනවා ඇත.

යෙදවුම් අතුරෙන් කොටසක් කෘෂි සේවා මධ්‍යස්ථාන මගින් සපයනු ලැබේ. දැනුම සහ තොරතුරු ද සැපයීමේ කාර්යය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට භාර වී ඇත. 'පුහුණු කිරීමේ සහ පරීක්ෂා කිරීමේ ක්‍රමය' යටතේ ගොවීන් පුහුණු කිරීමේ එක්තරා ක්‍රමයක් දැනට පවත්නා නමුදු මෙම ක්‍රමයෙහි ඵලදායිතාවය විනිශ්චය කිරීම සඳහා මනා ඇගැයීමක් අවශ්‍යව ඇත. මෙහි සමහර දුර්වලතාවන් පවත්නා බව පෙනෙන්නට තිබේ. සැබෑ ජීවන තත්ත්වය පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ඇතැයි සිතිය හැක්කාවුන්, පළපුරුදුකම් ඇත්තාවුන් ගොවීන්ට ශිල්පීය කරුණු පිළිබඳව පහදා දීමට තරම් හැකියාවක් නොමැති විය හැකි පහළ මට්ටමේ ව්‍යාප්ති නියෝජිතයන් විසින් කරුණු කියා දෙනු ලැබීම උදාහරණයක් හැටියට මෙහිලා දැක්විය හැකි ය. දෙවනුව, යෙදවුම් සැපයීම හා සම්බන්ධ ශිල්පීය උපදෙස් වශයෙන් අළුත් දැනුමක් ලබා දීම අතරෙහි සම්බන්ධතාවයක් නොමැත. තුන්වැනිව, මෙම ක්‍රමය සාමූහික ක්‍රියාකාරිත්වය වර්ධනය කරනවාට වඩා මුණ ගැසෙන සම්බන්ධක ගොවීන් ගේ පැත්තට වැඩිපුර බරය. අසල්වැසි ගොවීන් විසින් යටකී සම්බන්ධක ගොවියා තම ගුරුවරයා වශයෙන් නිරායාශයෙන් පිළිගනු ලබනු ඇතැයි මූලික වශයෙන් කල්පනා කළ ද සැබෑ ජීවිතයෙහි දී එය සිදු වන්නේ නැත. සිවුවැනිව, සම්බන්ධක ගොවීන් අත මිට සරු පුද්ගලයන් විය හැකි අතර, නිලධාරීන් සමඟ එකතු වී ඔවුන් මෙම ක්‍රමයෙහි වාසි ය ඒකාධිකාරයකට හරවා ගැනීමට ඉඩ තිබේ. පස්වැනිව, සම්බන්ධක ගොවීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී නොවූවකි. සම්බන්ධක ගොවීන් තෝරා ගැනීමෙහි දී දෙපාර්තමේන්තු නිලධාරීහු ප්‍රමුඛත්වයක් ගෙන ක්‍රියා කරති.

සුළු ගොවීන්ගේ සංවිධානවල නායකයන් සඳහා වන කළමණාකරණ පුහුණු ව්‍යාපෘතිය අත් හද බැලීම පිණිස ලෝක බැංකු ආධාර ද ඇතිව බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් දැනට ක්‍රියාත්මක කෙරෙන කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ගල්ගමුව කෘෂි සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තෝරා ගන්නා ලදී. නියමු ව්‍යාපෘතිය යටතේ සුළු ගොවීන් ගේ කණ්ඩායම් ඇති කෙරේ. එම කණ්ඩායම්වල නායකයෝ (විදහෝවිරුන්) කොට්ඨාශ මට්ටමේ නිලධාරීන් විසින් කෘෂි සේවා මධ්‍යස්ථානවල දී පුහුණු කරවනු ලබති. ●